# රණවිරුවන් පාවාදෙන - ඊළමට පාර කපන ජිනීවා මර උගුලට, පය තබන්න එපා!

## ජාත්‍යන්තර බෙදුම්වාදී මාර්ග සිතියම එළිදරව් කරමින් ගෝලීය ශ්‍රී ලාංකික සංසදය ප්‍රමුඛ ජාතික සංවිධාන 58ක් මගින් විදේශ අමාත්‍ය විජිත හේරත් මහතාට සංදේශයක්...

**ඒ මගින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 60 වන සැසියේදී. ශ්‍රී ලංකාවේ රාජ්‍යය මුහුණ දීමට නියමිත තීරණාත්මක අභියෝගය හමුවේ.**

**ආණ්ඩුවේ ස්ථාවරය පිළිබඳව ආණ්ඩුවට සහ රට වැසියාට ප්‍රභල අනතුරු ඇඟවීමක් සිදුකර ඇත.**

**ගරු විජිත හේරත් මැතිතුමනි,**

1. මේ වන විට ඔබතුමා ඉතා හොඳින් දන්නා පරිදි ජාත්‍යන්තර මාධ්‍ය වාර්තාවලට අනුව මෙම වසරේ සැප්තැම්බර් 8 දින ඇරඹීමට නියමිත එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සමුළුවේ 60 වන සැසිවාරයේදී ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කෙරෙන යෝජනාව බ්‍රිතාන්‍යය සහ කැනඩාව මූලිකත්වයෙන් ඉදිරිපත් කෙරෙන බව එම රාජ්‍යයන් විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍යයට දැනුම් දී ඇත. ඊට අදාළව ඔබතුමා විසින් දේශීය පුවත්පත්වලට ප්‍රකාශ කර ඇති පරිදි එම යෝජනාව, බොහෝවිට 60/1 අංක දරන යෝජනාව, මීට පෙර ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කළ යෝජනාවලට වඩා මෘදු ස්වරූපයක් ගනු ඇති බවට ඔබතුමා විශ්වාස කරන බව තහවුරු වේ.

2. ඊට අමතරව, ජාත්‍යන්තර ප්‍රජාව අපේක්ෂා කරන පරිදි වගවීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුව විසින් දේශපාලන මැදිහත්වීම් වලින් තොරව ඉදිරියට ගෙනයන බව සහ එම ක්‍රියාවලිය තුළ ස්වාධීන අභිචෝදක කාර්යාල පනත සම්මත කරන බව ඔබතුමා විසින් ප්‍රකාශ කළ බව වාර්තා විය. එසේම මෙම වසරේ පෙබරවාරි මාසයේදී 59 වැනි සැසියේදී ඔබතුමා විසින් සත්‍ය සෙවීමේ කොමිසම තවදුරටත් ශක්තිමත් කර ක්‍රියාත්මක කරන බවට ජාත්‍යන්තර ප්‍රජාවට සහතික විය.

3. ඒ අතර අගෝස්තු 4 වැනිදා බෙදුම්වාදී මතවාද නියෝජනය කරන දේශපාලන පක්ෂ කිහිපයක් විසින් ජාත්‍යන්තර මානව හිමිකම් කොමසාරිස් වොල්කර් ටර්ක් වෙත යවන ලද ලිපියකට ක්ෂණිකව පිළිතුරු ලබා දෙමින් කොමසාරිස්වරයා සඳහන් කරන්නේ 60 සැසියේදී ඉදිරිපත් කරන තම වාර්තාව මගින් අදාළ පක්ෂවල අපේක්ෂා ඉටු කරන බවය. එහිදී ශ්‍රී ලංකාවේ වර්තමාන රජය ඊට එකඟතාවය පලකරන බවද ඔහුගේ ප්‍රකාශය මගින් ගම්‍ය විය.

4. ඒ අනුව පැහැදිලි වන්නේ ජාත්‍යන්තර ප්‍රජාව ලෙස හඳුන්වන ජාත්‍යන්තර බෙදුම්වාදී සංවිධාන ජාලය විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය යොදා ගනිමින් 2009 වසරේ සිට බලපෑම් සහගතව ඉදිරියට ගෙන එන ලද ක්‍රියාවලියට අදාළ අවසන් කොන්දේසි කිහිපය ඉටු කිරීමට වර්තමාන රජය අපේක්ෂා කරන බවය. එම තත්ත්වය තුළ ඔබතුමා ඇතුළු රජයේ පාර්ශව විසින් අදාළ ජාත්‍යන්තර පාර්ශ්වවලට යම් සහතිකයක් ලබාදීම නිසා ඔබතුමා සඳහන් කළ ආකාරයට ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කෙරෙන යෝජනාව මෘදු වන බවට සහතිකයක් ඔබතුමාට ලැබී ඇති බවට උපකල්පනය කිරීම සාධාරණ වේ.

5. එම තත්වය තුළ ජාත්‍යන්තර ප්‍රජාව බලපෑම් කිරීම මගින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන සහ ඔබතුමාගේ ආණ්ඩුව විවිධ ජාත්‍යන්තර සංවිධාන සහ පුද්ගලයින් සමඟ පවතින බැඳීම් නිසා හෝ ස්වේච්ඡාවෙන් ඉටු කිරීමට අපේක්ෂා කරන කොන්දේසි මොනවාද යන්න තර්කානුකූලව වටහා ගැනීම ඉතා වැදගත් බව ඔබතුමා පිළිගන්නවා ඇත. ඒ පිළිබඳව ඉතා හොඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා යුද්ධය අවසන් කිරීමෙන් පසුව ප්‍රභාකරන්ගේ තුවක්කුවෙන් ඉටුකර ගත නොහැකි වූ දේ ඉටුකර ගැනීම සඳහා ජාත්‍යන්තර මැදිහත්වීම් යොදා ගන්නා බව පළමුවෙන්ම තේරුම් ගත යුතුය. ඒ බව පළමුවෙන්ම තහවුරු වූයේ දින 3ක් ඇතුළත එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා ශ්‍රී ලංකාවට කඩාවැදි ඒකාබද්ධ ප්‍රකාශයක් මගින් බාහිර බලවේග විසින් හසුරුවනු ලබන ක්‍රියාවලියකට ශ්‍රී ලංකාවේ රාජ්‍යය පටලවා ගැනීම තුළය. ඊට පෙර යුද්ධයේ අවසාන දින කිහිපය තුළ ජාත්‍යන්තර මැදිහත්වීමක් මත ප්‍රභාකරන් මුදා ගැනීම මගින් එතැන් සිට ඊනියා සාම ක්‍රියාවලිය සඳහා කේවල් කිරීම මුල් කරගත් ජාත්‍යන්තර මැදිහත්වීමකට පාර කපා ගැනීමට උත්සාහ කළ ද ආරක්ෂක හමුදාව විසින් එම උත්සාහය ව්‍යාර්ථ කළ බව ඔබට මතක ඇත.

6. ඒ ආකාරයට එක්සත් ජාතීන්ගේ සංවිධානය රටේ අභ්‍යන්තර දේශපාලන තීන්දු වලට මැදිහත්වීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමෙන් පසුව 2009 මැයි 26-27 දිනවල කැඳවූ 11 වැනි විශේෂ සැසියේදී ශ්‍රී ලංකාවේ එකඟතාවය හෙවත් සම අනුග්‍රහය සහිතව ශ්‍රී ලංකාවට අදාළව යෝජනාවක් සම්මත කළ බව ඔබට මතක ඇතැයි අප විශ්වාස කරමු. එම යෝජනාව මගින් ශ්‍රී ලංකාවේ රජය 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමට එනම්, බෙදුම්වාදී මාර්ග සිතියමේ මූලික බාධකය ඉවත් කිරීමට එකඟ විය. එම එකඟතාවය අදාළ ක්‍රියාවලියේ ප්‍රධානතම අපේක්ෂාව බව ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවලට එරෙහිව කිසිදු යුද අපරාධ චෝදනාවක් හෝ වගවීමේ ක්‍රියාවලියක් පිළිබඳව අදාල යෝජනාවට ඇතුල් නොකිරීම මගින් පැහැදිලි වේ. එපමණක් නොව එම යෝජනාව මගින් යුද ගැටුම් අවසන් කිරීම හෙවත් බෙදුම්වාදී යුද්ධය පරාජය කිරීම සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් අවසන් සටනේදී ප්‍රාණ ඇපයට තබා ගත් ලක්ෂ සංඛ්‍යාත අහිංසක සිවිල් ජනතාව මුදා ගැනීම පිළිබඳව රජයට ප්‍රශංසා කරනු ලැබීය.

7. නමුත් ජාතික බලවේගවල බලපෑම නිසා එදා ජිනිවාහි නිත්‍ය නියෝජිත ලෙස කටයුතු කළ ආචාර්ය දයාන් ජයතිලක මහතා විසින් ලබාදුන් පොරොන්දුව, එනම් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමට හෝ ඒ පිළිබඳව කතා කිරීමට සමාජයේ කිසිදු ඉඩක් නොවීය. එසේ වුවත් එදා පැවති රජය ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විසින් එල්ල කරන චෝදනාවල බලපෑමෙන් මිදීම, විශේෂයෙන්ම අනාගතයේදී ජාත්‍යන්තර මැදිහත්වීමක් සඳහා පවතින අවකාශය සීමා කිරීම සඳහා දීර්ඝ කාලීන සාමය සහ සංහිඳියාව මුල් කරගත් දේශීය විමර්ශන ක්‍රියාවලියක් ආරම්භ කරනු ලැබීය. ඒ අනුව 2010 දී උගත් පාඩම් කොමිසම නමින් දේශීය විමර්ශන යාන්ත්‍රණයක් ආරම්භ කරනු ලැබූ බව ඔබතුමාට මතක ඇත.

8. එසේ වුවත් ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේගවල අපේක්ෂාව එය නොවන බව එම කොමිසමේ වාර්තාව පිටවීමට පෙර එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස්වරයා විසින් අත්තනෝමතික ලෙස තමාගේ පුද්ගලික දැනුවත් වීම සඳහා තොරතුරු ලබා ගැනීමේ නාමයෙන් ජාත්‍යන්තර විමර්ශන යාන්ත්‍රණයක් ආරම්භ කිරීම මගින් පැහැදිලි විය. ඒ අනුව දරුස්මාන් කොමිසම ලෙස හැඳින්වූ එම යාන්ත්‍රණයේ වාර්තාව 2011 දී නිකුත් කරනු ලැබීය. ඉන්පසුව දරුස්මාන් වාර්තාව මගින් ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවලට එරෙහිව එල්ල කරනු ලැබූ චෝදනා හෙවත් ඊනියා යුද අපරාධ චෝදනා යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ රජය සමඟ කේවල් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වූ බව ඔබතුමා පිළිගන්නවා ඇත. එම ක්‍රියාවලිය තුළ ජාත්‍යන්තර බෙදුම්වාදී සංවිධාන ජාලය විසින් විවිධ ක්‍රියාමාර්ග ආරම්භ කළ අතර දරුස්මාන් කමිටුවේ සාමාජිකාවක් වූ යැස්මින් සූකා නැමැත්තිය විසින් ITJP නැමති සංවිධානය යොදා ගනිමින් ආරක්ෂක හමුදා ප්‍රධානීන් 58 දෙනෙකු නම් කරමින් ඔවුන්ට එරෙහිව යුද අපරාධ චෝදනා ගොනු කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ බව රහසක් නොවේ.

9. කෙසේ වෙතත් එදා පැවැති රජය එම බලපෑම්වලට යටත් නොවීම නිසා 2012 දී රාජ්‍ය නොවන සංවිධාන ජාලය විසින් බීබීසී ගුවන් විදුලිය මගින් ප්‍රකාශ කරන්නේ එම රජය යටතේ 13 වැනි සංශෝධනය බලාත්මක කිරීම මගින් දෙමළ ජනතාවට දීර්ඝකාලීනව සාධාරණය ඉටු කිරීමට කටයුතු නොකරන බැවින් රජය පරාජයට පත් කළ යුතු බවය. ඒ අතර එම වකවානුවේදීම මඩකලපුවේදී ඉලංගෙයි තමිල් අරුසු කච්චි පක්ෂයේ සමුළුව අමතමින් ආර්. සම්බන්ධන් මහතා සඳහන් කරන්නේ තමා ඇතුළු උතුරේ දේශපාලන පක්ෂ නායකයින් පිළිගන්නා ආකාරයට යුද්ධය අවසන් වුවත් යුද්ධයෙන් ඉටු කර ගැනීමට අපේක්ෂා කළ අරමුණ හෙවත් ඊළාම් රාජ්‍යය ලබා ගැනීමේ අරමුණ පෙරදැරිව කටයුතු කරනු ඇති බවය. ඒ සඳහා යුද්ධය වෙනුවට අවිහිංසාවාදී දේශපාලන සටන් යොදා ගන්නා බවද ඔහු සඳහන් කළේය. ඊට අමතරව එම ක්‍රියාවලිය ජාත්‍යන්තර මැදිහත්වීම මත සිදුකෙරෙන බවද ඔහු විසින් සඳහන් කරන්නට යෙදුනි. ඒ සියලු සාක්ෂි මඟින් පැහැදිලි වන්නේ යුද අපරාධ චෝදනා එල්ල කිරීමේ පළමු අරමුණ ඊනියා දේශපාලන විසඳුමක් ලෙස 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්ම කිරීම සඳහා බලපෑම් කිරීම වන අතර දෙවන අරමුණ ආරක්ෂක හමුදා වලට මානසික බාධක පැනවීම සහ අවසානයේදී දුර්මුඛ සහ දුර්වල කිරීම මගින් පළමු අරමුණ සඳහා අවශ්‍ය මූලික පූර්ව කොන්දේසිය සපුරා ගැනීම බව ඔබතුමාට පිළිගැනීමට සිදුවේ.

10. ඒ ආකාරයට වර්ධනය වන ජාත්‍යන්තර බලපෑම්වලට මුහුණ දීම සඳහා සහ ජාත්‍යන්තර මැදිහත්වීම් වළක්වමින් දීර්ඝ කාලීන සාමය සහ සංහිඳියාව සඳහා පියවර ගැනීම මුල් කරගෙන ශ්‍රී ලංකාවේ රජය විසින් 2013 දී අතුරුදහන් වූවන් පිළිබඳව සොයා බලා ඔවුන්ට යුක්තිය ඉටු කිරීම සඳහා මැක්ස්වේල් පරණගම කොමිසම යනුවෙන් හැඳින්වූ ජනාධිපති කොමිසම පත් කළ බව ඔබතුමාට මතක ඇත. ලිපිගොනු 5000 කට අධික ප්‍රමාණයක විමර්ශන සිදුකරමින් ඉතා සාර්ථකව ඉදිරියට ගමන් කළ එම ක්‍රියාවලිය තුළ බෙදුම්වාදී ජාත්‍යන්තර බලවේගවලට සටන් පාඨ අහිමි වීමේ තර්ජනයක් එල්ල විය. ඊට මුහුණ දීම සඳහා ජාත්‍යන්තර මානව හිමිකම් කොමසාරිස්වරුන් රට තුළට පැමිණ බලපෑම් එල්ල කළ අතර ඔවුන්ගේ වාර්තා මගින් දේශිය යාන්ත්‍රණ ප්‍රතිඵලදායක නොවන බව සදහන් කරමින් ජාත්‍යන්තර මැදිහත්වීම් සාධාරණීකරණය කරනු ලැබීය. අවසානයේ දී මහා ප්‍රහාරය ආරම්භ වූ අතර 2014 දී මානව හිමිකම් කවුන්සිලයේ 25 වැනි සැසියේදී ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කළ 25/1 යෝජනාව මගින් මහ කොමසාරිස්වරයා මගින් යුධ අපරාධ විමර්ශන යාන්ත්‍රණයක් පිහිටුවා වාර්තාවක් ලබාගැනීමට තීන්දු වූ බව ඔබතුමා පිළිගන්නවා ඇත.

11. ඉන්පසුව ශ්‍රී ලංකාවේ රාජ්‍යයේ අනුග්‍රහය මත ආරක්ෂක හමුදා පාවාදීම හෙවත් හමුදා නිලධාරීන්ට එරෙහිව යුද අපරාධ චෝදනා එල්ල කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණය ආරම්භ වන්නේ 2015 දී ඔබතුමාලාගේ අනුග්‍රහය යටතේ බලයට පැමිණි ඊනියා යහපාලන ආණ්ඩුව මගින් බව ඔබතුමාට පිළිගැනීමට සිදුවේ. එවකට විදේශ අමාත්‍යවරයා ලෙස කටයුතු කළ මංගල සමරවීර මහතා අමාත්‍ය මණ්ඩලයේ විධිමත් අවසරයක් නොමැතිව ජාත්‍යන්තර ගිවිසුමක් මගින් බැඳීමක් ඇතිකරගන්නා ආකාරයට අදාළ ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබීය. ඒ අනුව 2015 සැප්තැම්බර් මාසයේදී පැවැත් වූ 30 වැනි මානව හිමිකම් සැසියේදී ඉදිරිපත් වූ යුද අපරාධ චෝදනා සහිත මහ කොමසාරිස් වාර්තාව සහ ඊට අනුව ආරක්ෂක හමුදාවට දඬුවම් කිරීම ප්‍රමුඛ රජය විසින් ඉටු කළ යුතු කොන්දේසි අඩංගු 30/1 යෝජනාව එදා පැවිති රජය විසින් ස්තුති පූර්වකව පිළිගන්නා ලද බව ඔබතුමාට මතක ඇත. එම යෝජනාව සකස් කිරීමේදී ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා ප්‍රමුඛ කණ්ඩායමක් විසින් ශ්‍රී ලංකාවේ බෙදුම්වාදී පක්ෂවල එකඟතාවය ලබාගත් බව ද අයිලන්ඩ් පුවත්පත වාර්තා කළේය.

12. ඒ අනුව 30/1 යෝජනාව බෙදුම්වාදී බලවේග වල අවසන් අරමුණු කරා ළඟාවීමේ මාර්ග සිතියම් බවට පත් වූ අතර එම යෝජනාව මගින් ක්‍රියාවලි 4ක් ආරම්භ විය. සාමය සහ සංහිඳියාවට අදාළ පූර්ව කොන්දේසි ලෙස ඒවා හැඳින්වූ අතර ඒ අතරින් පළමුවැන්න, සත්‍යසෙවීම හෙවත් දේශීයව යුද අපරාධ චෝදනා විභාග කිරීම සඳහා නීතිමය ආවරණය සහිත විශේෂිත යාන්ත්‍රණයක් පිහිටුවීමය. දෙවැන්න, වගවීම එනම් චෝදනා එල්ල වන ආරක්ෂක හමුදා නිලධාරීන්ට පරිපාලන වශයෙන් සහ අපරාධ නීතිය යටතේ දඬුවම් කිරීමය. තුන්වැන්න, වින්දිතයන්ට වන්දි ගෙවීම සහ වින්දිතයින් මෙන්ම සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා නීතිමය යාන්ත්‍රණ පිහිටුවීමය. හතරවැන්න, හෙවත් අවසාන අරමුණ ගැටුම් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා පියවර ගැනීම හෙවත් 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමය. විදේශ අමාත්‍යවරයා ලෙස මෙම සමස්ත ක්‍රියාවලියට අදාළ මහා පින්තූරය පිළිබඳව ඔබතුමාට ඉතා හොඳ අවබෝධයක් තිබිය යුතු යැයි අපි කල්පනා කරමු.

13. ඒ අනුව 31/1 යෝජනාවේ අඩංගු කොන්දේසි සැපරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩු දෙකක්, එනම් යහපාලන ආණ්ඩුව සහ ඊට පසුව රටේ ජනාධිපතිවරයා පලවා හැරීමෙන් පසුව පිහිට වූ අන්තර් කාලීන පාලනය විසින් ඉතා ඕනෑකමින් සහ උනන්දුවෙන් කටයුතු කළ බව ඔබතුමාට මතක් කරමු. එම ක්‍රියාවලිය තුළ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම සඳහා ව්‍යවස්ථා සංශෝධන ගෙන ඒමට සහ පරිපාලන වශයෙන් ඊට පහසුකම් සැලසීම සඳහා ප්‍රබල උත්සාහයක් ගනු ලැබූ නමුත් මහා සංඝරත්නය ප්‍රමුඛ ජාතිකාදී බලවේග වල විරෝධය නිසා එම කොන්දේසිය ඉටු කිරීමට නොහැකි විය. නමුත් රණවිරුවන්ට දඬුවම් කිරීම හෙවත් රණවිරු දඩයම මගින් ආරක්ෂක හමුදා බිඳ වැට්ටවීමේ ක්‍රියාවලියට අදාළව පහත සඳහන් ආකාරයට නීති 7ක් සම්මත කළ බව ඔබතුමාට නැවත නැවතත් මතක් කළ යුතුව ඇත.

**I. අතුරුදහන් පුද්ගලයින් පිළිබඳ කාර්යාල පනත - 2016**

සාක්ෂි ආඥා පනත අදාළ නොවන ලෙස අතුරුදන් කිරීම් පිළිබඳව චෝදනා සහ සාක්ෂි ගොනු කිරීම මෙන්ම නීතිපතිට සහ රජයට ඊට අදාළව නිර්දේශ ලබාදීම එම පනතේ මූලික අරමුණ විය. සාක්ෂි ආඥාපනත අදාළ නොවීම නිසා ව්‍යාජ සාක්ෂිකරුවන් සහ බොරු සාක්ෂි මත ආරක්ෂක හමුදා නිලධාරින්ට එරෙහිව චෝදනා ගොනු කිරීමේ චෝදනා කාර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා එමගින් නීතිමය ආවරණය ලැබුණි.

**II. පිටුවහල් කිරීමේ සංශෝධන පනත - 2017**

ඒ මගින් ආරක්ෂා හමුදා නිලධාරීන්ට ජාත්‍යන්තර අධිකරණ බලය යටතේ නඩු පවරන අවස්ථාවක එම නිලධාරීන් පිටුවහල් කිරීම සඳහා ඒ මගින් ප්‍රතිපාදන සැලසේ.

**III. වන්දි ගෙවීම පිළිබඳ කාර්යාල පනත -2018**

මෙම පනත මගින් වින්දිතයන්ට වන්දි ගෙවීම සඳහා සාධාරණ බව පෙනෙන ප්‍රතිපාදන පනවා ඇති බව කියැවුණද ඒ මගින් සැබෑ වින්දිතයන් මෙන්ම ව්‍යාජ වින්දිතයන්ද පැමිණිලි කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ කිරීම ප්‍රධාන අරමුණක් බව ප්‍රතික්ෂේප කළ නොහැක.

**IV. බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් වැළැක්වීමේ අන්තර්ජාතික ප්‍රඥප්ති පනත - 2018**

ඒ මඟින් අතුරුදන් වූවන් පිළිබඳව පැමිණිලි විභාග කිරීමට අමතරව යුද අපරාධ මහාධිකරණයක් ද පිහිටුවනු ලැබීය.

**V. අපරාධ කටයුතු පිළිබඳ අන්‍යෝන්‍ය සහයෝගීතා පනත - 2018**

එම පනත මගින් චෝදනා එල්ලවන රණවිරුවන්ට එරෙහිව ජාත්‍යන්තර අධිකරණ බලය ක්‍රියාත්මක කරන අවස්ථාවලදී ඊට අදාළ තොරතුරු ලබාදීමට සහ වරදකරුවන් වන නිලධාරීන්ට දේශීයව දඬුවම් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසේ.

**VI. වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සහ සහාය ලබාදීමේ සංශෝධන පනත - 2023**

ඒ මගින් සාධාරණ ලෙස පෙනෙන ප්‍රතිපාදන හරහා ව්‍යාජ වින්දිතයින් ලෙස සහ පාපොච්චාරණය කිරීම සඳහා යොදාගන්නා පුද්ගලයින් දිරිමත් කිරීම සිදුවේ.

**VII. ජාතික සමගිය සහ සංහිඳියාව කාර්යාල පනත - 2023**

මෙම කාර්යාලය මගින් ඉහත සඳහන් කළ හතර වැදෑරුම් ක්‍රියාවලිය දිරිමත් කිරීම, ආවේක්ෂණය කිරීම මෙන්ම ඊට අදාළව බලපෑම් කිරීම සඳහා සහ විශේෂයෙන්ම සත්‍ය සෙවීමේ කොමිසම පිහිටුවීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම අරමුණු කෙරිණි.



දැන්වීමකි